# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1635 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 29/12/ 2023<br>පැය 1000 |

**මාධ්‍ය නිවේදනය**

**කනම්පැල්ල රජමහා විහාරස්ථානයේ වාර්ෂික පෙරහර හේතුවෙන් රථ වාහන ගමනා ගමනය සීමා කිරීම - කොස්ගම පොලිස් වසම.**

කොස්ගම පොලිස් වසමේ කනම්පැල්ල රජමහා විහාරස්ථානය මගින් පවත්වනු ලබන වාර්ෂික පෙරහර 2023.12.29 වන අද දින සවස 5.00 සිට 2023.12.30 වන දින අළුයම 1.00 දක්වා වීදි සංචාරය කිරීමට නියමිතය. පෙරහර විහාරස්ථානයෙන් ගමන් ආරම්භ කර පූගොඩ කොස්ගම මාර්ගයට පිවිස කනම්පැල්ල හන්දියෙන් කොළඹ රත්නපුර මාර්ගයට පැමිණ කොළඹ දෙසට ගමන් කර කඩුගොඩ හන්දියෙන් ආපසු හැරී එම මාර්ගයේම ගමන්කර විහාරස්ථානයට පිවිසීමට නියමිතව ඇත.

පෙරහර ගමන්කරන කාලය තුල පූගොඩ කොස්ගම මාර්ගය සවස 05.00 සිට අළුයම 01.00 දක්වා කාලය තුල වාහන ගමනා ගමනය සීමා කරනු ලබන අතර රාත්‍රී 11.00 සිට අළුයම 00.30 දක්වා කාලය තුල රත්නපුර කොළඹ මාර්ගයේ රථ වාහන ගමනා ගමනය සීමා කිරීමට කටයුතු කරනු ඇත. එබැවින් එම කාල තුල ඉහත මාර්ග භාවිතා කිරීමට අපේක්ෂිත රියදුරුන්ගෙන් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙසට පොලිසිය ඉල්ලා සිටියි.

**විකල්ප මාර්ග :-**

- කොළඹ දෙස සිට අවිස්සාවේල්ල දෙසට ධාවනය කරන රථ වාහන කලුඅග්ගල හන්දියෙන් දකුණට හැරී ලබුගම මාර්ගයේ තුම්මෝදර හරහා පුවක්පිටිය දක්වා පැමිණ අවිස්සාවේල්ල දෙසට ගමන් කල හැකිය.

- අවිස්සාවේල්ල දෙස සිට කොළඹ දෙසට ගමන් කරන රථ වාහන පුවක්පිටිය හන්දියෙන් වමට හැරී තුම්මෝදර, ලබුගම හා කලුඅග්ගල හරහා පැමිණ කොළඹ දෙසට ගමන් කල හැකිය.

- ❖ හැටන් දෙස සිට කොළඹ දෙසට ගමන් කරන වාහන තල්දූව හන්දියෙන් හැරී අම්තිරිගල, නඩුවත්ත හරහා හංවැල්ල කිරිදිවැල මාර්ගයට පිවිස කොළඹ දෙසට ගමන් කළ හැකිය.

- ❖ අවිස්සාවේල්ල දෙස සිට පූගොඩ දෙසට ගමන්කරන වාහන ඇස්වත්ත හන්දියෙන් දකුණට හැරී කිරිදිවැලට ගමන්කර පූගොඩ නගරය දක්වා ගමන් කල හැකිය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**